සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2017 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2017-07-15
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ශෙහාන්** ඔහුගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තෙන් සිටී. ඔහු ප්‍රධාන පෙළේ උපකාරක පන්තියක් පැවැත්වෙන ස්ථානයක් අසල කුඩා කෙටි කෑම අවන්හලක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. ඔහුගේ මූලික ආයෝජනය රු.50,000/- කි. ඒ හා සමාන ව්‍යාපාරයන්හි යෙදී සිටින අවන්හල් කීපයක් ළඟපාත තිබේ.

(A) පහත සඳහන් එක් එක් අදියරේදී, බොහෝ සෙයින් වියහැකි **ශෙහාන්ගේ** ව්‍යාපාරික අරමුණු **හඳුනා දක්වන්න**:

(a) ඔහුගේ ව්‍යාපාරයේ මූලික අදියරේදී.

(b) ඔහු ව්‍යාපාරයේ සාර්ථක වුවහොත්, වර්ෂයක් ඉකුත්වීමෙන් පසු. (ලකුණු 02)

(B) **ශෙහාන්ගේ** ව්‍යාපාරයට බලපාන සමාජයීය සහ සංස්කෘතික සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

"අවදානම් කළමනාකරණ රාමුවක්, අවදානම් ඇගයීම, අවදානම් තුනී කිරීම, පාලන පරීක්ෂාව සහ සමාලෝචනය යනාදියෙන් සමන්විත වේ."

(A) අවදානම් තුනී කිරීමේ (mitigating) ක්‍රම දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(B) අවදානම් අඩුකිරීමේ ක්‍රම සඳහා උදාහරණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

"විගණක විසින් සහතිකවීමේ කාර්යභාරයක් සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම සඳහා, වෘත්තීය සංශය දෘෂ්ඨියකින් (professional skepticism) යුතුව ඒවා සිදුකළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී සිය වෘත්තීය විනිශ්චය පවත්වාගත යුතුය."

(A) "වෘත්තීය සංශය දෘෂ්ඨිය" (Professional Skepticism) යන පදය **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(B) විගණකයින් විසින් වෘත්තීය විනිශ්චය ව්‍යවහාර කළ යුතු විගණනයේ ක්ෂෙත්‍ර තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ පටිපාටි, විගණන ආයතන මට්ටම්වලදී සහ තනි තනි විගණනයන් මත යන දෙකෙහිම ක්‍රියාත්මක කළ යුතුය. තනි තනි විගණනයක එක් එක් සහායක විසින් ඉටුකරනු ලබන කාර්යයන්, ප්‍රවීණතාව සහ පළපුරුද්ද සහිත පුද්ගලයන් විසින් සමාලෝචනය කළ යුතුය.

(A) විගණන ආයතනයක් විසින් පිළිපැදිය යුතු තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ පටිපාටිවල අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(B) කණ්ඩායමේ වඩා කණිෂ්ඨ සාමාජිකයෙකුගේ වැඩ, කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු විසින් සමාලෝචනය කිරීමේදී, සහතික කරගත යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

---

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ස්වර්ණා සෙරමික් (පෞද්ගලික) සමාගම,** බිම් උළු, බිත්ති උළු සහ නාන කාමර අයිතම සිල්ලරට සහ තොග වශයෙන් වෙළඳාමේ නිරතව සිටී. **සීමාසහිත ස්වර්ණා සෙරමික් (පෞද්ගලික) සමාගමේ** බාහිර විගණකයන් ලෙස ඔබගේ විගණන සමාගම පත්කර තිබෙන අතර, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කරනු ලබන කණ්ඩායමේ කාර්යභාර ජ්‍යෙෂ්ඨයා ලෙස ඔබව පත් කර තිබේ.

සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් රු. මිලියන 150 ක බැංකු ණයක් අයදුම් කර ඇති අතර, එම ණය මුදල ලබාදීම සඳහා, වර්ෂ පහක(05) මූල්‍ය පුරෝකතනයක් බැංකු කළමණාකරු ඉල්ලා ඇත. වර්ෂ 5 ක මූල්‍ය පුරෝකතනය මත සහතිකවීමේ කාර්යභාරයක් ඉටු කරදෙන ලෙස ඔබගේ විගණන සමාගමෙන් ඉල්ලීමක් කර තිබේ. සමාගමේ මූල්‍ය නොවන පැතිකඩයන් පිළිබඳව සමාගම විසින් වාර්තා කර තිබෙන ප්‍රධාන කාර්යසාධන දර්ශක (key performance indicators) ඇගයීම් කිරීමටද අධ්‍යක්ෂවරුන් විසින් තවදුරටත් ඉල්ලා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(A) "සහතිකවීමේ කාර්යභාරයක්" (assurance engagement) යනු කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(B) **සීමාසහිත ස්වර්ණා සෙරමික් (පෞද්ගලික) සමාගම** විසින් ඔබගේ විගණන සමාගමෙන් ඉටුකරන ලෙස ඉල්ලා ඇති ඉහත සඳහන් එක් එක් සේවාවන් වෙනුවෙන් විගණන සමාගමට අදාල කරගත හැකි යෝග්‍ය කාර්යභාර වර්ගය (type of engagement) **හඳුනාගන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

විගණනය භාර හවුල්කරු විසින්, **සීමාසහිත AB (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනයේදී, විගණන කණ්ඩායම විශේෂයෙන් අවධානය යොමු කළ යුතු ක්ෂෙත්‍ර පිළිබඳව ඔවුන් දැනුවත්කොට උපදෙස් දෙන ලදී. විගණනය භාර හවුල්කරු විසින් ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමේ වැදගත්කම පිළිබඳව ද අවධාරණය කරන ලදී. විගණන සාක්ෂි, විශ්වසනීය විය යුතු බවද, විගණනයට අදාල විය යුතු බවද ඔහු තවදුරටත් අවධාරණය කරන ලදී. විගණන කණ්ඩායම විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ඇතැම් නිශ්චිත පටිපාටි පිළිබඳව නිගමනය කරන ලදී.

**සීමාසහිත AB (පෞද්ගලික) සමාගමේ** කාර්යාල ගොඩනැගිල්ල මෙහෙයුම් කල්බද්දක් යටතේ ලබාගෙන තිබුණි. කල්බදු කුලී වියදම් පෙර වර්ෂය සමග සැසඳීමේදී 20% කින් වැඩිවී තිබූ බව විගණකගේ අවධානයට ලක්විය. විගණක විසින් මෙම කරුණ වැඩ පත්‍රිකාවේ (working paper) සඳහන් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(A) විගණන සාක්ෂි එක්රැස් කිරීමේදී, විගණන සාක්ෂිවල විශ්වසනීයත්වය වැඩිකර ගන්නා ආකාර හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(B) කල්බදු කුලී වියදමේ වැඩිවීම පරීක්ෂා කිරීම සඳහා විගණන සාක්ෂි ලබාගැනීමේදී, යොදාගතහැකි විගණන පටිපාටි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත කුවුන් හෝල්ඩින්ග් සමාගම** දිප ව්‍යාප්තව පරිපාලිත 12 ක් ඇති සමූහ සමාගමකි. සමූහ සමාගම, කෘෂිකාර්මික සහ සත්ව පාලන ව්‍යාපාරයෙහි නිරතව සිටී. සමූහ සමාගම සහ පරිපාලිතයන් අතර, සැළකිය යුතු පරිමාවක අන්තර්-සමාගම්, (intra-group) විකුණුම් සහ ගැනුම් ගනුදෙනු පවතී. ඔබ, එහි පරිපාලිතයක් වන **සීමාසහිත ග්‍රීන් (පෞද්ගලික) සමාගමේ** බාහිර විගණකවරයායා.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(A) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (related party transactions) සම්බන්ධයෙන්, **සීමාසහිත ග්‍රීන් (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයේ වගකීම් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) **සීමාසහිත ග්‍රීන් (පෞද්ගලික) සමාගමේ** වියහැකි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගැනීම සඳහා ඔබ විසින් ඉටු කරනු ලබන විගණන පටිපාටි පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(C) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සහ ශේෂ සම්බන්ධයෙන්, **සීමාසහිත ග්‍රීන් (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයෙන් ලබාගැනීමට යන ලිඛිත නියෝජනයේ (written representation) දැක්වෙන එක් කරුණක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

(A) ඔබ, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ටෙස්ට් සමාගමේ** විගණන කණ්ඩායමේ සාමාජිකයෙකි. **සීමාසහිත ටෙස්ට් සමාගම** මාෂ්මෙලෝස් පැකට් නිෂ්පාදනය කර විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටියි. ගනුදෙනුකරුවෙකුගෙන් ඇණවුමක් ලැබුනු විට පමණක් මාෂ්මෙලෝස් නිෂ්පාදනය කරනු ලැබේ.

ගනුදෙනුකරුගේ ඇණවුම මත පදනම්ව, නිෂ්පාදන පාලක විසින් නිෂ්පාදන ඇණවුමක් පිළියෙල කරනු ලබන අතර, එය මුළුතැන්ගෙයි විධායක වෙත යවනු ලැබේ. නිෂ්පාදන ඇණවුම මත පදනම්ව, මුළුතැන්ගෙයි විධායක විසින් අමුද්‍රව්‍ය ගබඩාවෙන්, අමුද්‍රව්‍ය ඉල්ලා සිටින අතර, ගබඩාවෙන් අමුද්‍රව්‍ය මුදාහරිනු ලැබේ. මේවා නිකුත් කරනු ලබන්නේ මුළුතැන්ගෙයි විධායක විසින් නිසි පරිදි අත්සන් කරන ලද ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාවක් [Material Requisition Note (MRN)] ලැබීමෙන් පසුව පමණි. ද්‍රව්‍ය අධියාචනා පත්‍රය මත පදනම්ව, ගබඩාව විසින් අදාල අමුද්‍රව්‍ය ප්‍රමාණ, ගබඩා විධායක විසින් අත්සන් කරන ලද අමුද්‍රව්‍ය නිකුත් කිරීමේ පත්‍රිකාව ද සමග නිකුත් කරනු ලැබේ. එක් එක් දිනය අවසානයේදී, ද්‍රව්‍ය අධියාචනා පත්‍ර, ද්‍රව්‍ය නිකුත් කිරීමේ පත්‍රිකා සමග මුළුතැන්ගෙය සහ ගබඩාව යන දෙකෙහිදීම ගලපා බලනු ලැබේ.

මාෂ්මෙලෝස් නිෂ්පාදනය කර පැකට්ටුවලට අසුරනු ලබන්නේ කර්මාන්තශාලා මුළුතැන්ගෙය තුළදීය. පැකැට්ටුවක සම්මත ප්‍රමාණය එක් පැකැට්ටුවකට මාෂ්මෙලෝස් 20 බැගින් වන අතර, එක් පැකැට්ටුවක බර ග්‍රෑම් 50 ක් විය යුතුය. නිෂ්පාදනය කරනු ලබන මාෂ්මෙලෝස් සංඛ්‍යාව සහ බර ප්‍රමාණයේ නිරවද්‍යතාව නිෂ්පාදන සහායකයින් විසින් අදාල නිෂ්පාදන ඇණවුම් සමග පරීක්ෂා කරනු ලබන අතර, නිමි භාණ්ඩ [Finished Goods (FG)] පැකැට්ටු ගබඩාවට මාරු කිරීමට බලය දෙමින් මුළුතැන්ගෙයින් මාරුකිරීමේ පත්‍රිකා අත්සන් කරදෙනු ලැබේ. මුළුතැන්ගෙයින් මාරුකිරීමේ පත්‍රිකා නොමැතිව නිමිභාණ්ඩ ගබඩාව, මාෂ්මෙලෝස් පැකැට්ටු බාර නොගනී. නිමි භාණ්ඩ ගබඩා විධායක විසින් කර්මාන්තශාලා පරිශ්‍රයෙන් නිමිභාණ්ඩ ගනුදෙනුකරු වෙත බාර දීමට පෙර, තුන් ආකාරයකින් ගලපා බලා (three-way matching), ගනුදෙනුකරුගේ ඇණවුමේ පිටපත, භාණ්ඩ බාරදීමේ සටහන (goods dispatch note) සහ විකුණුම් ඉන්වොයිසිය සමඟ පරීක්ෂා කරබලා සාක්ෂි වශයෙන් අත්සන් කරනු ලබයි.

එක් එක් දිනය අවසානයේ, විකුණුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ බාරදීමේ වාර්තාවක් පිළියෙල කරනු ලබන අතර, එය දිනය සඳහා වාර්තා වී ඇති විකුණුම් පරිමාව සමග සසඳා බලයි. ඔවුන් තවදුරටත් බාරදෙන ලද භාණ්ඩ නියැදියක් ලබාගෙන අදාල ගනුදෙනුකරුගේ ඇණවුම්, නිෂ්පාදන ඇණවුම්, ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සහ අමුද්‍රව්‍ය නිකුතු පත්‍රිකා, මුළුතැන්ගෙයින් මාරු කිරීමේ පත්‍රිකා, භාණ්ඩ බාරදීමේ පත්‍රිකා සහ විකුණුම් ඉන්වොයිසි සමග පසුවිපරම් කර බලා, වෙනස්වීම් කිසිවක් වෙතොත් ඒවා සමග ගැලපේදැයි පරීක්ෂා කර බලයි (cross check).

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාවක [Material Requisition Note (MRN)] ඇතුලත් කළ යුතු වැදගත් කරුණු තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) පහත දැක්වෙන එක් එක් පාලනයන්ගේ මෙහෙයුම් සඵලදායිතාව (operating effectiveness) ඇගයීම සඳහා විගණන පටිපාටියක් බැගින් **හඳුනා දක්වන්න**:

(i) ගනුදෙනුකරුවන්ගේ ඇණවුම් මත පදනම්ව නිෂ්පාදන ඇණවුම් නිකුත් කිරීම.

(ii) වලංගු නිෂ්පාදන ඇණවුමක් තිබේනම් පමණක්, ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාවක් (Material Requisition Note) නිකුත් කිරීම.

(iii) ද්‍රව්‍ය නිකුත් කිරීම්, ද්‍රව්‍ය අධියාචනා සමග ගැලපීම.

(iv) නිමි භාණ්ඩ ගබඩා විධායක විසින් ඉටුකරනු ලබන තුන්ආකාර ගැලපීම.

(v) විකුණුම් දෙපාර්තමේන්තුවෙන් ඉටුකෙරෙන පාලන. (ලකුණු 05)

(c) අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා විගණක විසින් ඉටුකළ යුතු විගණන පටිපාටි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(d) **සීමාසහිත ටෙස්ට් සමාගමේ** විකුණුම් පරීක්ෂාවට ලක්කිරීමේදී, අවධානයට යොමුකළ යුතු මූල්‍ය ප්‍රකාශන සැදැහුම් (financial statement assertions) තුනක්(03) **පැහැදිලි කරන්න** (ලකුණු 06)

(B) "වර්තමානයේ බොහෝ ව්‍යාපාර, ව්‍යාපාරික කටයුතු සඳහා බහුල වශයෙන් තොරතුරු තාක්ෂණය යොදා ගනී. එමනිසා, එවන් පරිසරයක් තුළ තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන (general controls) ඉතා වැදගත් වේ."

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් එක් එක් තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් සඳහා උදාහරණ දෙක(02) බැගින් **ලැයිස්තුගත කරන්න**:

(a) පරිගණක යෙදවුම් (application) සංවර්ධනය.

(b) දත්ත ගොනුවලට අනවසර ලෙස සංශෝධන සිදුකිරීම වැළැක්වීමේ පාලන.

(c) මෙහෙයුම්වල අඛණ්ඩභාවය සහතික කෙරෙන පාලන.

(d) වැඩසටහනක අනවසර ලෙස වෙනස්කිරීම් වැළැක්වීම හෝ අනාවරණය කර ගැනීම. (ලකුණු 08)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) ඔබගේ විගණන සේවාදායකයාගේ දේපළ, පිරියත සහ උපකරණවල වර්ෂ අවසාන ශේෂයන්හි පැවැත්ම පිළිබඳව විගණන පටිපාටි ඉටුකිරීමේ කාර්යභාරය ඔබවෙත පැවරී තිබේ. ඔබගේ විගණන කටයුතු සඳහා, දේපළ, පිරියත සහ උපකරණ ලේඛණය ඔබ වෙත සපයා ඇත. දේපළ, පිරියත සහ උපකරණ ලේඛණයේ සඳහන් ශේෂ, පොදු ලෙජරයේ සඳහන් ශේෂ සමග ගැළපේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දේපළ, පිරියත සහ උපකරණ සත්‍යාපනය කිරීම සඳහා විගණක විසින් ඉටුකරනු ලබන විගණන පටිපාටි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) පාලන පරීක්ෂාවන් (test of controls) සහ තහවුරු කිරීමේ පටිපාටි (substantive procedures) අතර වෙනස **සඳහන් කරන්න**. (ලකුණු 03)

(B) ඔබගේ විගණක සේවාදායකයාගේ 2017 මාර්තු 31 දිනට ගොඩනැගිලිවල වෙනස්කම් දැක්වෙන උපලේඛණය (schedule of movement) පහත පරිදි වේ:

| | **රු.** |
|---|---:|
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | 15,000,000 |
| එකතු කළා: වර්ෂය තුළ එකතුකිරීම් | 7,000,000 |
| අඩු කළා: වර්ෂය තුළ ඉවත් කිරීම් | - |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | **22,000,000** |

ඉහත දෑ පිළිබඳව ඔබ විසින් ඉටුකරන ලද විගණන පටිපාටි මගින් පෙන්නුම් කළේ රු.2,500,000/- ක් වූ එකතු කිරීම්, සමාගම් ගොඩනැගිල්ලේ දකුණු කොටස අළුත්වැඩියා කිරීම සඳහා අදාලවන බවයි. මෙම වියදම් දරා ඇත්තේ මූල්‍ය වර්ෂයේ අවසානයට ආසන්නවයි. ඉතිරි එකතුකිරීම් අදාල වන්නේ, නව සමාගම් කාර්යාලය ඉදිකිරීම සඳහා වේ. යෝජිත විගණන ගැලපුම්, විගණන සේවාදායකයාගේ කළමනාකාරිත්වය විසින් ඔවුන්ගේ ගිණුම් පොත්වල ගලපා නොතිබුණි. මෙම විගණන සේවාදායකයා සඳහා වන ප්‍රමාණාත්මකභාවය රු.800,000/- ක් ලෙස ඔබ නිගමනය කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඔබගේ විගණන සේවාදායකයාගේ මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය සම්බන්ධව ඉහත කරුණේ බලපෑම **විමසන්න**. (වෙනත් අවප්‍රකාශන නොමැතිබව උපකල්පනය කරන්න). (ලකුණු 06)

(b) විගණකගේ මතයේ ඡේදය හැර විගණකගේ වාර්තාවේ මූලිකාංග (elements) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(C) ඔබ, **සීමාසහිත ශිරාත් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ** විගණක වේ. එහි ප්‍රදර්ශනාගාරය කොට්ටාව හංදිය අසල පිහිටා තිබේ. **සීමාසහිත ශිරාත් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ** විගණක ලෙස, ඔබ විසින්, එහි කළමනාකරණ අධ්‍යක්ෂ සමග යහපත් සම්බන්ධතාවයක් ගොඩනගාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉහත කී ප්‍රදර්ශනාගාරය පිහිටි ගොඩනැගිල්ලේ ඔබගේ විගණන ආයතනයේ ශාඛා කාර්යාලයක් පිහිටුවා ගැනීමට ඔබට ඉඩදී ඇත. ප්‍රදේශයේ පවතින වෙළෙඳපොළ මිලගණන් සමඟ සසඳා බැලීමේදී ඉතාමත් අඩු මාසික කුලියකට කළමනාකරණ අධ්‍යක්ෂ ඔබ සමග එකඟ වී ඇත. අතුරු විගණනය පැවැත්වීම සඳහා ඔබ විසින් ජ්‍යෙෂ්ඨයෙකු පත්කර තිබේ. මෙම ජ්‍යෙෂ්ඨයා විසින් **සීමාසහිත ශිරාත් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ** විගණනය පසුගිය වර්ෂ 12 පුරාම සිදුකර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත විස්තර කර ඇති තත්ත්වයන් යටතේ, මූලික මූලධර්මවලට අනුගතවීමේ තර්ජන (threats to compliance) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන් විසින් පිළිපැදිය යුතු පහත සඳහන් මූලික මූලධර්ම **පැහැදිලි කරන්න**:

(i) අරමුණුගත බව (Objectivity).

(ii) වෘත්තිමය නිපුණත්වය (Professional Competence).

(iii) වෘත්තිමය හැසිරීම (Professional Behaviour). (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාළ කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |